කැළණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014/15

2020 - අගෝස්තු

**BCOM E 3025 - ව්‍යවසායකත්වය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයයි : (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ. ව්‍යවසායකත්වය හඳුන්වා එහි ප්‍රධාන ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ආ. සමහර පුද්ගලයින් ව්‍යවසායකයින් වීමට බලපාන හේතු මොනවාද ?

(ලකුණු 06)

ඇ. “රටක සංස්කෘතිය එම රටේ ජනතාව අතර ව්‍යවසායක අභිප්‍රාය කෙරෙහි යම් බලපෑමක් ඇති කරන බව පර්යේෂණවලින් ඔප්පු වූ සත්‍යයකි”.

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ ද ? ප්‍රායෝගික උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 02

අ. ව්‍යවසායකත්වයේදී අදහස සහ අවස්ථාව අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 04)

ආ. ප්‍රායෝගික උදාහරණ සමඟ ව්‍යවසායකත්ව අවස්ථා හඳුනා ගැනීමේ විවිධ ක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. “සමහර පුද්ගලයින් අවස්ථාවන් හඳුනා ගැනීමට දක්ෂ නමුත් අනෙක් අය එසේ නොවේ.”

ඔබ මෙම ප්‍රකාශයට එකඟ ද ? විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

අ. නවෝත්පාදන ක්‍රියාවලි චක්‍රය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ. විසිඑක්වන සියවස සඳහා නවෝත්පාදන කිරීම තුළින් සමහර නවීන ව්‍යාපාර බිහි වී තිබේ. යථා ලෝකයේ ප්‍රායෝගික උදාහරණ දෙකක් භාවිතා කරමින් ඉහත ප්‍රකාශය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. සැබෑ ලෝකයෙන් ප්‍රායෝගික උදාහරණ යොදා ගනිමින් නිර්මාණශීලිත්වය, නව නිපැයුම් සහ නව්‍යකරණය අතර වෙනස විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. වර්ධන උපාය මාර්ග දෙයාකර වේ. කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ. " ව්‍යාපාරයේ වර්ගය කුමක් වුවත්, වර්ධනය සෑම ව්‍යවසායකයෙකුගේම ව්‍යාපාර ආකෘතියේ අත්‍යවශ්‍ය අංගයකි", ව්‍යාපාර වර්ධනය සඳහා හේතු සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ. තාක්ෂණ ක්ෂේත්‍රයේ සමාගමක් නිදසුන් වශයෙන් ගෙන ව්‍යවසායක දිශානතියේ අංග පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. ව්‍යාපාර සැලැස්ම ද්විත්ව භාවිත ලේඛනයක් යැයි පැවසීමට හේතුව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී අවස්ථා හඳුනා ගැනීම සහ ශක්‍යතා විශ්ලේෂණය අතර සම්බන්ධතාවය විවේචනාත්මකව සාක්ච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ. ව්‍යවසායකයෙකුගේ තිරසාර ව්‍යාපාරයක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීම අත්‍යවශ්‍ය වේ. ඔබ මෙම ප්‍රකාශයට එකඟද ? ඔබේ පිළිතුරට සාධාරණ හේතු දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 06

අ. සමායතන ව්‍යවසායකත්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ?

(ලකුණු 04)

ආ. සමායතන ව්‍යාපාර වර්ග පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ. වර්තමාන වසංගත තත්වය තුළ සමාගමකට සමායතන ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)